**කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව - 2023**

**---------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්‍ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------- | ---------------------- | ---------- |
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු සේවක ණය ශේෂය රු.244,400 ක්, විවිධ තොග ශේෂය රු.109,237 ක්, පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් දායක අරමුදලට ගෙවිය යුතු ශේෂය රු.65,737 ක් හා වරිපනම් බදු හිග ආදායම් ශේෂය රු.56,658 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණු අතර ස්ථාවර තැන්පතු දෙකක ලැබිය යුතු පොලිය රු.3,440,754 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ආදායම් ශීර්ෂ 04 ක් වෙනුවෙන් කලින් ලද රු.145,227 සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | ගෙවිය යුතු රු.58,127 ක් වෙනුවෙන් විවිධ ණය හිමියන් යටතේ ප්‍රතිපාදන සලසා නොතිබුණු අතර කර්මාන්ත ණයහිමි සඳහා රු.403,539 ක් වැඩියෙන් ප්‍රතිපාදන සලසා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | ස්ථාවර තැන්පතු දෙකක් වෙනුවෙන් ලැබිය යුතු පොලිය රු.1,263,277 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාතර්‍ා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනයන්හි පැවති ගිණුම් විෂයයන් 02 ක ශේෂයන් හා ඊට අදාල උපයෝගී ලේඛණ/උපලේඛණවල දැක්වෙන ශේෂ අතර රු.14,473,421 ක වෙනසක් පැවතුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 16,809,116 ක් වූ ගිණුම් විෂයයන් 05 ක් සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | කේවල ලිපිගොනු හා උපලේඛණ සොයාගත නොහැකි බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | මු.රෙ. 103 හා 104 | 2020 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනාගත් රු.80,121 ක භාණ්ඩ ඌනතාවය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු නොකර 2021 ජනවාරි 12 දින පැවති මාසික සභා රැස්වීමේදී කපා හැරීමට තීරණය කර තිබුණි. | කඩිනමින් එම වාර්තාව විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | මු.රෙ. 371 | මුදල් රෙගුලාසි වලින් බැහැරව ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන සඳහා සභාවේ ලේකම් විසින් රු.341,000 ක | පෙන්වා දී ඇති සියළු නිරීක්ෂණයන් නිවැරදි කර ගනිමින් ඉදිරියේදි සිදු කරනු ලබන සියළුම ප්‍රසම්පාදන කටයුතු 1988 ප්‍රාදේශීය සභා(මූල්‍ය හා පරිපාලන) | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| අත්තිකාරම් මුදලක් ලබාගෙන තිබුණි. | රීති සහ 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව සිදු කරනු ලබන බව. | |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 1,469,241 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 1,662,212 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 4,270,000 | 3,095,961 | 2,756,975 | 5,853,303 | 3,243,280 | 7,426,909 | 3,671,984 | 5,514,317 |
| කුලී | 9,266,800 | 9,974,533 | 12,335,479 | 3,964,191 | 8,204,800 | 9,004,009 | 6,767,122 | 6,325,137 |
| බලපත්‍ර ගාස්තු | 1,286,500 | 1,429,581 | 1,431,881 | 36,000 | 1,018,500 | 1,391,990 | 2,229,813 | 38,300 |
| වෙනත් ආදායම් | 27,912,000 | 22,416,817 | 22,602,742 | - | 1,055,000 | 26,382,554 | 26,906,202 | 185,925 |
| **එකතුව** | 42,735,300 | 36,916,892 | 39,127,077 | 9,853,494 | 13,521,580 | 44,205,462 | 39,575,121 | 12,063,679= |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂය ආරම්භයට හිඟ වරිපනම් බදු ශේෂය රු.1,309,064 ක් වූ අතර වරිපනම් ඒකක 1531 කට අදාලව වර්ෂය තුලදී බිල් කිරීම් රු.1,364,994 ක් සමඟ රු.2,674,058 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුලදී මුළු අයවීම් රු.1,448,656 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.1,225,402 ක හිඟ ශේෂයක් පැවතුණි. | 2024 මාර්තු 31 දිනට හිගයෙන් රු.138,849 මුදලක් අයකරගෙන ඇති බවත් රු.1,086,015 මුදල ඉදිරියේදී අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභාව සතු කඩ කුලී ගෙවන කඩ කාමර 231 ක් පැවති අතර ඉන් කඩ කාමර 66 කින් රු.3,726,430 ක හිඟ ආදායමක් අයවිය යුතුව පැවතුණි. ඉන් කඩ කාමර 06 කට අදාලව රු.100,000 ට වැඩි හිඟ ශේෂයන් පැවතුණි. | රු.506,693 ක මුදලක් අයකරගෙන ඇති බවත්, ඉතිරි හිඟ මුදල අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |
| (ඇ) | දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ අංක දපපා/පපාකො/ 2010/01 දරන හා 2010 දෙසැම්බර් 27 දිනැති චක්‍රලේඛයේ 04 වන හා 05 වන ඡේද ප්‍රකාරව පිළිවෙළින් වෙළෙඳ සංකීර්ණ 05 කට අයත් කඩකාමර 10 කින් රු.125,000 ක එක්වන් මුදල් අයකර ගෙන නොතිබුණ අතර සභාව සතු නව වෙළෙඳ සංකීර්ණයෙහි බිම් මහලෙහි කඩ කාමර අංක 06 හි ගිවිසුම යාවත්කාලීන කර නොතිබුණි. | එක්වන් මුදල් අයකර ගැනීමට ලිපි මගින් දැනුවත් කර ඇති බව හා ගිවිසුම් යාවත්කාලීන කිරීමට දැනුවත් කර ඇති බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් උසාවි දඩ වෙනුවෙන් රු.589,938 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.15,755,647 ක් ලැබිය යුතුව තිබුණි. | 2024 මාර්තු 31 දින වන විට මුද්දර ගාස්තු රු.8,249,188 ක මුදලක් අය වී ඇති බවත්, ඉතිරි මුදල ඉදිරියේදී අය කර ගැනීමට කටයුතු කරන බවත්, උසාවි දඩ ශේෂය අය කර ගෙන ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------- | -------------------- | ----------- |
| (අ) | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 126 (viii) වගන්තිය ප්‍රකාරව සභාවට අයත් නාගරික නොවන සීමාවෙහි ඉදිකිරීම්වලට අදාලව සැලසුම් අනුමත කිරීම හා නීත්‍යානුකූල නොවන ඉදිකිරීම් සම්බන්ධව ක්‍රියාමාර්ග ගැනීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණ පිළිගන්නා බව. | අතුරු ව්‍යවස්ථා සකස් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභා බල ප්‍රදේශයේ දෛනිකව එක්රැස්වන දිරන හා නොදිරන කසළ විධිමත්ව බැහැර කිරීමට සභාව විසින් විධිමත් ක්‍රමවේදයක් අනුගමනය නොකරන අතර දිරන කසළ කඹුරුපිටිය සතිපොළ භූමියට හා නොදිරන කසළ පැරණි ආදාහනාගාර භූමියට බැහැර කරන බව නිරීක්ෂණය විය. | පොල භූමියේ කසළ එක්රැස් කිරීම අවම කර ඇති බවත්, නොදිරන කසළ මොන්රෝවියාවත්ත කසළ අංගනය වෙත ගෙන ගොස් විධිමත් ලෙස බැහැර කිරීමටත් කටයුතු කර ඇති බව | විධිමත් කසළ කළමනාකරණ පද්ධතියක් හඳුන්වා දිය යුතුය. |

## 3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| -------------------- | --------------- | ------------- |
| ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධානවලින් බැහැරව පළාත් කළමනාකරණ සේවා නිලධාරී සංගමයේ වාර්ෂික සම්මේලනයට සහභාගී වීම සඳහා සභාවේ නිලධාරීන්ට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සැලසීම වෙනුවෙන් පසුගිය හා සමාලෝචිත වර්ෂයන්හිදී රු.150,900 ක් බාහිර පාර්ශවයන් වෙත ගෙවා තිබුණි. | දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ හා දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය ලැබී ඇති බව. | ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | -------------------- | -------------------- | ----------- |
| (අ) | 2016 සිට 2020 දක්වා කාල පරිච්ඡේදය තුල ගොඩනැගිලි අයදුම්පත් 407 ක් අනුමත කර තිබූ අතර ගොඩනැගිලි සංවර්ධන බලපත්‍ර ලබාදී වසර 3 ත් 7 ත් අතර කාලයක් ගතවී තිබූ නමුත් ඉන් ගොඩනැගිලි 35 කට පමණක් අනුකූලතා සහතික ලබාගෙන තිබුණි. | වර්තමානයේදී ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේදී ප්‍රධාන කොන්දේසියක් ලෙස අනුකූලතා සහතික ලබා ගැනිමෙන් පසු භාවිතයට ගත යුතු බව දැන්වීමට කටයුතු කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2021 නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග/රෙගුලාසි ඇතුළත් 2021 ජුලි 08 දිනැති අංක 2235/54 දරන ගැසට් නිවේදනයේ II වන කොටසේ 4(1) හා 28(1) වගන්ති වලින් බැහැරව සංවර්ධන බලපත්‍රයක් නොමැතිව පිළිවෙළින් 2021 වර්ෂයේදී මාපලාන ප්‍රදේශයේ කනත්තවත්ත හෙවත් කැටකාලගහවත්ත පුටුගහකොරටුව නැමැති අක්කර 01 පර්චස් 15.20 ක ඉඩම කැබලි කර විකුණා තිබුණ අතර සංවර්ධන බලපත්‍රයක් නොමැතිව සභා බලප්‍රදේශයේ නාගරික සීමාව තුල අළුතින් ඉදිකර තිබූ හෝ ඉදිකරමින් පැවති ගොඩනැගිලි 04 ක් ද විය. | අඩුපාඩු සම්පූර්ණ කර අයදුම්පත්‍රය නැවත ඉදිරිපත් කරන ලෙස දන්වා යවා ඇති බව. | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2018 වර්ෂයේ සිට 2023 වර්ෂයේ ජුනි 30 දක්වා කාලසීමාව තුළ අනුබෙදුම් කර විකුණන ලද ඉඩම් 10 කට අදාළව තාවකාලික තක්සේරු වටිනාකම හෝ විකුණුම්කරු විසින් ලබා දී තිබූ අපේක්ෂිත විකුණුම් වටිනාකම මත සියයට 1 ක ගාස්තුව අයකර තිබුණු අතර විකුණන ලද ඉඩම් කැබලිවල සත්‍ය විකුණුම් වටිනාකම මත අයවිය යුතු සියයට 1 ක මුදල් අය කර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | සත්‍ය විකුණුම් වටිනාකම ලබා ගෙන ඉදිරියේදී හිඟ ගාස්තු අය කිරීමට කටයුතු කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3 (අ) ප්‍රකාරව ප්‍රසම්පාදනයන්ට අදාලව පැවැත්වූ ප්‍රසම්පාදන රැස්වීම්වලට අදාල වාර්තා පවත්වාගෙන යා යුතු වුවද සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී සිදුකරන ලද රු.1,694,409 ක වටිනාකමින් යුතු ප්‍රසම්පාදන 23 කට අදාල තීරණ වාර්තා සභාව විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි. | ඉදිරියේදී මෙවැනි මග හැරීම් වළක්වා ගැනීම සඳහා අදාල නිලධාරීන් දැනුවත් කිරීමටත් කටයුතු කර ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු.324,835 ක බිල්පත් වටිනාකමකට වැඩ අවසන් කර තිබූ, මාර්ග 2 ක් සංවර්ධනය කිරීමේදී මාර්ගයේ පස් සන මීටර් 208.45 ක් කපා ඉවත් කිරීම සඳහා ගෙවීම් කිරීමේදී දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් යන්ත්‍ර භාවිතයෙන් පස් කැපීම සඳහා E1-027 යටතේ 2022 වර්ෂයේ හඳුන්වා දී තිබූ රේටයන් භාවිතා නොකර E1-003 යටතේ මිනිස් ශ්‍රමය යොදවා එම කාර්යය ඉටු කිරීමට හඳුන්වා දී තිබූ රේටයන් භාවිතා කිරීම නිසා රු. 259,040 ක මුදලක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි. | තාක්ෂණ නිලධාරීන් විසින් විමසුමට පිළිතුරු සපයා නොමැති බව. | නියමිත රේටයන් භාවිතා කළ යුතුය. |
| (ආ) | මාර්ග 03 ක හා කාණුවල පස් කපා සංවර්ධනය කිරීම සඳහා රු.297,255 ක් වැය කර තිබූ අතර ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් යන්ත්‍ර භාවිතයෙන් එම කාර්යය සිදු කිරීම සඳහා E1-027 හා DR – 005A යටතේ හඳුන්වා දී තිබූ රේටයන් භාවිතා නොකර මිනිස් ශ්‍රමය යොදවා එම කාර්යය සිදු කිරීම සඳහා E1-003 හා DR – 001 යටතේ හඳුන්වා දී තිබූ රේටයන් භාවිතා කර ගෙවීම් කිරීම සඳහා රු.167,000 ක් වැඩිපුර ඇස්තමේන්තු කර තිබුණි. | තාක්ෂණ නිලධාරීන් විසින් විමසුමට පිළිතුරු සපයා නොමැති බව. | නියමිත රේටයන් භාවිතා කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) | සභාව විසින් 2022 හා 2023 වර්ෂවල සභා අරමුදල් ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද කර්මාන්ත 02 කට අදාළව අංක 01 වැඩ විෂය ඉටු කිරීමේදී සභාව විසින් යන්ත්‍ර භාවිතයෙන් පස් කැපීම සිදුකර ඒ සඳහා ගෙවීම් කිරීමේදී මිනිස් ශ්‍රමයෙන් අත්තිවාරම් හා මාර්ග උරහිස් පිරවීම සඳහා දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් E1-001 යටතේ හඳුන්වා දී තිබූ රේට යොදා ගැනීම නිසා පස් ඝන මීටර් 191.55 ක් කැපීම සඳහා රු.495,850 ක මුදලක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි. තවද උක්ත මාර්ගවල පස් අතුරා තැලීම සඳහා ගෙවීම් කිරීමේදී දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් EW-003A යටතේ මෝටර් ග්‍රේඩරය හා රෝල භාවිතා කර පස් තැලීම සඳහා ගෙවීම් කිරීමට හඳුන්වා දී තිබූ රේට භාවිතා කළ යුතුව තිබූ නමුත් ඒ වෙනුවට EW-004 හා EW-006 රේට භාවිතා කිරීම නිසා කොන්ත්‍රාත්කරුට රු.102,418 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. | තාක්ෂණ නිලධාරීන් විසින් නියමිත රේටයන් විමසුමට පිළිතුරු සපයා භාවිතා කළ යුතුය. නොමැති බව. |
| (ඈ) | මහජන පොල භූමියේ මාළු ලැල්ල ඉදිකිරීමට යෝජිත භූමියට යාබදව පවතින කාණුවේ පැති බැම්ම ඉදිකිරීමේ කර්මාන්තයේ වැඩ විෂය අංක 06 යටතේ පැතිබැම්ම ඉදිකිරීමට අදාළව දෙවන පන්තියේ දැව ලැලි භාවිතා කර හැඩයම් වර්ග මීටර් 87.60 ක් සැකසීම වෙනුවෙන් ගෙවීම් කිරීමේදී දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2022 සැප්තැම්බර් මාසයේ ST-057 යටතේ හඳුන්වා දී තිබූ රේටය භාවිතා කර වර්ග මීටරයකට රු.3,394.50 බැගින් රු.297,858 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. හැඩයම් සඳහා පදම් කළ ලැලි (Plywood) පුවරු භාවිතා කර තිබූ අතර ඒ අනුව හැඩයම් සැකසීම සඳහා ගෙවීම් කිරීමේදී දකුණු පළාත් ඉංජිනේරු සේවා කාර්යාලය විසින් 2022 අගෝස්තු 22 දින ඉදිරිපත් කර තිබූ ගොඩනැගිලි මිල ගණන් ලේඛණය අනුව Ct-36 යටතේ හඳුන්වා දී තිබූ රු.1,439.00 ක රේටය භාවිතා කර ගෙවීම් කළ යුතුව තිබූ නමුත් එම රේටය වෙනුවට ST-057 රේටය භාවිතා කිරීම නිසා වර්ග මීටරයකට රු.1,955.50 බැගින් රු.171,302 ක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි. | තාක්ෂණ නිලධාරීන් විසින් නියමිත රේටයන් විමසුමට පිළිතුරු සපයා භාවිතා කළ යුතුය. නොමැති බව. |
| (ඉ) | ප්‍රාදේශීය සභා පොළ භූමියෙහි මාළු ලැල්ල ඉදිකිරීමේ කර්මාන්තයේ වැඩ විෂය අංක 06 යටතේ හැඩයම් සැකසීම සඳහා ගෙවීම් කිරීමේදී දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2022 සැප්තැම්බර් මාසයේ ST-057 යටතේ දෙවන පන්තියේ දැව ලැලි භාවිතා කර හැඩයම් සැකසීම සඳහා හඳුන්වා දී තිබූ රු.3,394.50 ක රේටය භාවිතා කර හැඩයම් වර්ග මීටර් 49.90 ක් වෙනුවෙන් රු.169,386 ක් ගෙවා තිබුණි. හැඩයම් සැකසීම සඳහා පදම් කළ ලැලි (Plywood) පුවරු භාවිතා කර තිබූ අතර ඒ සඳහා දකුණු පළාත් ඉංජිනේරු සේවා | තාක්ෂණ නිලධාරීන් විසින් නියමිත රේටයන් විමසුමට පිළිතුරු සපයා භාවිතා කළ යුතුය. නොමැති බව. |

කාර්යාලය විසින් 2022 අගෝස්තු 22 දින ඉදිරිපත් කර තිබූ ගොඩනැගිලි මිල ගණන් Ct-36 යටතේ හඳුන්වා දී තිබූ රු.1,439,00 ක රේටය භාවිතා කර ගෙවීම් කළ යුතුව තිබූ නමුත් එම රේටය වෙනුවට ST-057 රේටය භාවිතා කිරීම නිසා වර්ග මීටරයකට රු.1,955.50 බැගින් රු.97,579 ක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි.

**3.6 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| --------------------- | -------------------- | ---------- |
| සභාවේ සේවය කළ, ස්ථානමාරුවී ගිය, සේවය හැර ගිය හා මියගිය සේවකයින් 17 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.214,341 ක ණය ශේෂය වසර ගණනාවක සිට අය නොවී පැවතුණි. | ඉදිරියේදී අයකරගැනීමට කටයුතු කරන බව. | ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |